තනතුරු පුරප්පාඩු

වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පළතුරු, මිරිස්, ළූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධන බීජ
නිෂ්පාදන හා උසස් තාක්ෂණ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය

හෙක්ටර් කොබ්බැකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

මෙම ආයතනයේ පහත සදහන් පුරප්පාඩු පිරවීම සදහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකීය පුරවැසියන්ගෙන් ඉල්ලුම්පත්‍ර කැඳවනු ලැබේ.

01. අතිරේක අධ්‍යක්ෂ - **(HM 2-1)**

02. අධි පර්යේෂක - **(HM 1-2)**

03. ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී - **(AR- 2)**

04. පර්යේෂණ නිලධාරී - **(AR- 1)**

05. ජ්‍යෙෂ්ඨ දත්ත විශ්ලේෂක - **(MM 1-1)**

06. ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාන නිලධාරී - **(MM 1-1)**

07. සංඛ්‍යාන නිලධාරී - **(JM 1-2)**

08. ක්‍රම විශ්ලේෂක - **(JM 1-2)**

09. ප්‍රවෘත්ති හා ප්‍රකාශන නිලධාරී **(ඉංග්‍රීසි/දෙමළ) - (JM 1-2)**

10. පරිපාලන නිලධාරී - **(JM 1-2)**

11. සංඛ්‍යාන සහකාර - **(MA 3)**

12. පුස්තකාල සහකාර - **(MA 2-2)**

13. පරිගණක තාක්ෂණ සහකාර - **(MA 2-2)**

14. ප්‍රවාහන සහකාර - **(MA 2-2)**

15. කලමනාකරණ සහකාර **(තාක්ෂණික නොවන) - (MA 1-2)**

වැඩි විස්තර සඳහා ආයතනයේ වෙබ් අඩවිය වන www.harti.gov.lk වෙතින් ලබා ගත හැකි අතර එහි සඳහන් අයදුම්පත සහතිකපත්වල පිටපත් සමඟ 2021 මාර්තු 12 වන දිනට හෝ පෙර ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

රජයේ ව්‍යවස්ථාපිත මණ්ඩල, සංස්ථා හෝ දෙපාර්තමේන්තුවල ඉල්ලුම්කරුවන් සිය ඉල්ලුම් පත්‍ර ආයතන ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කළ යුතුය. අයදුම්කරන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙලවරෙහි පැහැදිලිව සඳහන් කළ යුතුය. මෙම අවශ්‍යතාවයන්ට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට සිදුවනු ඇත.

අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරි
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
114, විජේරාම මාවත,
කොළඹ 07. (011 – 2696981)

01. අතිරේක අධ්‍යක්ෂ

අධ්‍යාපන සුදුසුකම්

බාහිර :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක විද්‍යාව (Science), කෘෂිවිද්‍යාව(Agriculture),සමාජ විද්‍යාව (Sociology), වාණිජ්‍යය (Commerce), ව්‍යාපාර පරිපාලනය(Business Administration) පිළිබඳව හෝ වෙනත් අදාළ ක්ෂේත්‍රයක විෂයධාරාවකින් උපාධියක් ලබා තිබීම.

සහ

විද්‍යාව (Science), කෘෂිවිද්‍යාව(Agriculture),සමාජ විද්‍යාව (Sociology), වාණිජ්‍යය (Commerce), ව්‍යාපාර පරිපාලනය(Business Administration) පිළිබඳව හෝ වෙනත් අදාළ ක්ෂේත්‍රයක විෂයධාරාවකින් පශ්චාත් උපාධියක්(Postgraduate Degree) ලබා තිබීම හෝ පිළිගත් වෘත්තිය ආයතනයක වෘත්තිය සාමාජිකත්වය ලබා තිබීම

සහ

පළමු උපාධියෙන් පසුව සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් වාණිජ ආයතනයක කළමනාකරණ මට්ටමේ වසර 20ක පළපුරුද්දක් ලබා තිබීම සහ ඒ අතරින් වසර 05ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ වීම.

හෝ

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක විද්‍යාව (Science), කෘෂිවිද්‍යාව(Agriculture),සමාජ විද්‍යාව (Sociology), වාණිජ්‍යය (Commerce), ව්‍යාපාර පරිපාලනය(Business Administration) පිළිබඳව හෝ වෙනත් අදාළ ක්ෂේත්‍රයක විෂයධාරාවකින් උපාධියක් ලබා තිබීම.

සහ

විද්‍යාව (Science), කෘෂිවිද්‍යාව(Agriculture),සමාජ විද්‍යාව (Sociology), වාණිජ්‍යය (Commerce), ව්‍යාපාර පරිපාලනය(Business Administration) පිළිබඳව හෝ වෙනත් අදාළ ක්ෂේත්‍රයක අදාළ විෂයධාරාවකින් දර්ශනපති උපාධියක්(Ph.D) ලබා තිබීම.
සහ

පළමු උපාධියෙන් පසුව සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් වාණිජ ආයතනයක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ වසර 05 ක පළපුරුද්දක් ලබා තිබීම.

අභ්‍යන්තර : අදාල තනතුර හා සම්බන්ධ සේවය ජ්‍යෙෂ්ඨ කළමනාකාර තනතුරක

යටත් පිරිසෙයින් වසර 05ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම. සහ

විෂයාන්තර කණ්ඩායම්වලට (Multi-Disciplinary teams) නායකත්වය දීම පිළිබඳව කුසලතාවයක් පෙන්වා තිබීම. මානව හා අනෙකුත් සම්පත් මැනවින් කළමනාකරණය කිරීම පිළිබඳව අත්දැකීම් තිබීම.

වයස : වයස අවුරුදු 35ට නොඅඩු හා අවුරුදු 55ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

වැටුප් කේතය සහ වැටුප් පරිමාණය

HM 2-1 : [රු. 91,645–2,700x12–124,045/-]

02. අධි පර්යේෂක

අධ්‍යාපන සුදුසුකම්

බාහිර :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක සමාජ විද්‍යාව(Sociology),ආර්ථික විද්‍යාව(Economics), ආර්ථිකමිතිකය (Econometrics), සංඛ්‍යානය(Statistics),කෘෂි විද්‍යාව(Agriculture),පෝෂණය (Nutrition),රාජ්‍ය ප්‍රතිපත්ති(Public Policy),ස්ත්‍රී පුරුෂ සමාජභාවිය අධ්‍යයන(Gender Studies),සන්නිවේදනය (Communication) හෝ අදාල වෙනත් ක්ෂේත්‍රයක උපාධියක් සහ පශ්චාත් උපාධියක් සමඟ සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් ආයතනයක අවම වශයෙන් අවුරුදු 18 ක

පර්යේෂණ පළපුරුද්දක් තිබීම සහ ඉන් අවුරුදු 05 ක් ජ්‍යෙෂ්ඨ පර්යේෂණ මට්ටමේ තනතුරක් දරා තිබීම.

අභ්‍යන්තර :

'ජ්‍යෙෂ්ඨ අධ්‍යයන හා පර්යේෂණ' කණ්ඩායමට අයත් ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරියෙකු ලෙස තනතුරට අදාළ වන විෂය ක්ෂේත්‍රයකින් අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

වයස : වයස අවුරුදු 35ට නොඅඩු හා අවුරුදු 55ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

වැටුප් කේතය සහ වැටුප් පරිමාණය

HM 1-2 : [රු. 81,670–2,270x15– 115,720/-]

03.ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී

අධ්‍යාපන සුදුසුකම් සහ පලපුරුද්ද

බාහිර අයදුම්කරුවන්

(අ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව

විද්‍යාලයක සමාජ විද්‍යාව (Sociology), ආර්ථික විද්‍යාව (Economics), ආර්ථික මිතිකය (Econometrics), සංඛ්‍යානය (Statistics),කෘෂි විද්‍යාව(Agriculture), පෝෂණය (Nutrition),රාජ්‍ය ප්‍රතිපත්ති (Public Policy),ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අධ්‍යයන (Gender Studies), සන්නිවේදනය (Communication) පිලිබඳව හෝ අදාල ක්ෂේත්‍රයන්හි විෂය සංයුතියකින් යුත් සිව් අවුරුදු විශේෂ උපාධි පාඨමාලාවක් හදාරා ප්‍රථම පෙළ හෝ දෙවන පෙළ ඉහළ සාමාර්ථයක් ලබා තිබීම.

හෝ

(ආ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිලිගත් විශ්ව විද්‍යාලයක සමාජ විද්‍යාව (Sociology), ආර්ථික විද්‍යාව (Economics), ආර්ථික මිතිකය (Econometrics), සංඛ්‍යානය (Statistics),කෘෂි විද්‍යාව(Agriculture), පෝෂණය (Nutrition),රාජ්‍ය ප්‍රතිපත්ති (Public Policy),ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අධ්‍යයන (Gender Studies), සන්නිවේදනය (Communication) පිලිබඳව හෝ අදාල ක්ෂේත්‍රයන්හි විෂය සංයුතියකින් යුත් සිව් අවුරුදු විශේෂ උපාධි පාඨමාලාවක් හදාරා දෙවන පෙළ පහළ සාමාර්ථයක් සහ අදාල ක්ෂේත්‍රයේ එක් වසරක පර්යේෂණ සහිත පශ්චාත් උපාධියක් ලබා තිබීම.

හෝ

(ඇ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිලිගත් විශ්ව විද්‍යාලයක සමාජ විද්‍යාව (Sociology), ආර්ථික විද්‍යාව (Economics), ආර්ථික මිතිකය (Econometrics), සංඛ්‍යානය (Statistics),කෘෂි විද්‍යාව(Agriculture), පෝෂණය (Nutrition),රාජ්‍ය ප්‍රතිපත්ති (Public Policy),ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අධ්‍යයන (Gender Studies), සන්නිවේදනය (Communication) පිලිබඳව හෝ අදාල ක්ෂේත්‍රයන්හි විෂය සංයුතියකින් යුත් උපාධිය සහ අදාල ක්ෂේත්‍රයේ දෙවසරක පර්යේෂණ සහිත පශ්චාත් උපාධියක් ලබා තිබීම.

සහ

(ඈ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිලිගත් විශ්ව විද්‍යාලයක සමාජ විද්‍යාව (Sociology), ආර්ථික විද්‍යාව (Economics), ආර්ථික මිතිකය (Econometrics), සංඛ්‍යානය (Statistics),කෘෂි විද්‍යාව(Agriculture), පෝෂණය (Nutrition),රාජ්‍ය ප්‍රතිපත්ති (Public Policy),ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අධ්‍යයන (Gender Studies), සන්නිවේදනය (Communication) පිලිබඳව හෝ අදාල ක්ෂේත්‍රයකින් ලබා ගත් ආචාර්ය උපාධියක් (Ph.D) සමග පළමු උපාධියෙන් පසුව

පර්යේෂණ කටයුතු පිලිබඳව අවම වශයෙන් අවුරුදු 08 ක පලපුරුද්දක් ලබා තිබීම.

සැ.යු. අදාල ක්ෂේත්‍රය පිලිබඳව පර්යේෂණ ග්‍රන්ථ පලකොට තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

අභ්‍යන්තර අයදුම්කරුවන්

ආචාර්ය උපාධියක් (Ph.D) සමග පර්යේෂණ නිලධාරි තනතුරේ වසර 08 ක පලපුරුද්ද ලබා තිබීම. දර්ශනපති (M.Phil)/ විද්‍යාපති (M.Sc.) උපාධියක් සමග පර්යේෂණ නිලධාරි තනතුරේ වසර 08 ක පලපුරුද්ද ලබා තිබීම.

සැ.යු. අදාල ක්ෂේත්‍රය පිලිබඳව පර්යේෂණ ග්‍රන්ථ පලකොට තිබීම අමතර සුදුසුකමකත් ලෙස සැලකේ.

වයස : අවුරුදු 30 කට නොඅඩු විය යුතු අතර අවුරුදු 55 කට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

වැටුප් සංකේතය හා වැටුප් තලය:

AR - 2 : [රු. 76,200–2,000x10– 96,200/-]

04. පර්යේෂණ නිලධාරී

සුදුසුකම් සහ පළපුරුද්ද

බාහිර අයදුම්කරුවන්

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක සමාජ විද්‍යාව (Sociology), ආර්ථික විද්‍යාව (Economics), ආර්ථික මිතිකය (Econometrics), සංඛ්‍යානය (Statistics) කෘෂි විද්‍යාව (Agriculture), පෝෂණය (Nutrition), රාජ්‍යප්‍රතිපත්ති (Public Policy), ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අධ්‍යයන (Gender Studies), සන්නිවේදනය (Communication) පිළිබඳව හෝ අදාළ ක්ෂේත්‍රයන් හි විෂය සංයුතියකින් යුත් සිව් අවුරුදු විශේෂ උපාධි පාඨමාලාවක් හදාරා ප්‍රථම පෙළ හෝ දෙවන පෙළ ඉහළ සාමාර්ථයක් ලබා තිබීම.

හෝ

(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක සමාජ විද්‍යාව (Sociology), ආර්ථික විද්‍යාව (Economics), ආර්ථික මිතිකය (Econometrics), සංඛ්‍යානය (Statistics) කෘෂි විද්‍යාව (Agriculture), පෝෂණය (Nutrition), රාජ්‍යප්‍රතිපත්ති (Public Policy), ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අධ්‍යයන (Gender Studies), සන්නිවේදනය (Communication) පිළිබඳව හෝ අදාළ ක්ෂේත්‍රයන් හි විෂය සංයුතියකින් යුත් සිව් අවුරුදු විශේෂ උපාධි පාඨමාලාවක් හදාරා දෙවන පෙළ පහළ සාමාර්ථයක් සහ අදාළ ක්ෂේත්‍රයේ එක් වසරකවත් පර්යේෂණ සහිත පශ්චාත් උපාධියක් ලබා තිබීම.

හෝ

(ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක සමාජ විද්‍යාව (Sociology), ආර්ථික විද්‍යාව (Economics), ආර්ථික මිතිකය (Econometrics), සංඛ්‍යානය (Statistics) කෘෂි විද්‍යාව (Agriculture), පෝෂණය (Nutrition), රාජ්‍යප්‍රතිපත්ති (Public Policy), ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අධ්‍යයන (Gender Studies), සන්නිවේදනය (Communication) පිළිබඳව හෝ අදාළ ක්ෂේත්‍රයන් හි විෂය සංයුතියකින් යුත් උපාධිය සහ අදාළ ක්ෂේත්‍රයේ දෙවසරක පර්යේෂණ සහිත පශ්චාත් උපාධියක් ලබා තිබීම.

වයස : අවුරුදු 22ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

වැටුප් කේතය හා වැටුප් පරිමාණය :

AR – 1 : (රු.53,150–1,375x10–1,910x15–95,550/-)

05. ජ්‍යෙෂ්ඨ දන්ත විශ්ලේෂක

බාහිර

තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම සහ උපාධිය ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 03 ක පළපුරුද්දක් ලබා තිබීම.

අභ්‍යන්තර

දන්ත විශ්ලේෂක තනතුරෙහි I ශ්‍රේණියේ (කණිෂ්ඨ කලමනාකාර) තනතුරක අවම වශයෙන් වසර 05ක සතුටුදායක සේවා කාලයක් ලබා තිබීම.

වයස :

අවුරුදු 30 කට නොඅඩු විය යුතු අතර අවුරුදු 45 කට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

වැටුප් සංකේතය හා වැටුප් තලය:

MM 1 – 1 : [රු. 53,175 -1,375x10- 1,910x15 - 95,575/-]

06. ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාන නිලධාරී

සුදුසුකම් සහ පළපුරුද්ද

බාහිර

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ක්ෂේත්‍රයට අදාළ උපාධියක් ලබා තිබීම සහ එම සුදුසුකම සම්පූර්ණ කිරීමෙන් පසු ක්ෂේත්‍රයට අදාළව වසර 03 ක පළපුරුද්ද

සහ

අ.පො.ස. (සා.පෙ.) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

අභ්‍යන්තර

"කණිෂ්ඨ කළමණාකරණ"I ශ්‍රේණියේ තනතුරක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් අවුරුදු පහක (05) සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

වයස

අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

වැටුප් සංකේතය හා වැටුප් තලය :

MM 1-1 : [රු. 53,175-1,375x10–1,910x15– 95,575/-]

07. සංඛ්‍යාන නිලධාරී

අධ්‍යාපන සුදුසුකම් සහ පළපුරුද්ද

බාහිර :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක සංඛ්‍යානය පිළිබඳ උපාධියක් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක අදාල ක්ෂේත්‍රයේ උපාධියක් සහ උපාධිය ලබා ගැනීමෙන් පසු රජයේ දෙපාර්තමේන්තුවක/ සංස්ථාවක/ මණ්ඩලයක හෝ පිළිගත් වාණිජ ආයතනයක අවම වශයෙන් වසරක (01) අදාළ ක්ෂේත්‍රයේ සේවා පළපුරුද්දක් ලබා තිබීම.

සහ

අ.පො.ස.(සා/පෙ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාවට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම.

අභ්‍යන්තර:

තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයෙහි'සංඛ්‍යාන සහකාර (I ශ්‍රේණිය)' තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

සැ.යු. - පරිගණක මෘදුකාංග භාවිතය පිළිබඳ හැකියාව අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

වයස:

අවුරුදු 22කට නොඅඩු විය යුතු අතර අවුරුදු 45කට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා වයස් සීමාව අදාළ නොවේ.

වැටුප් සංකේතය හා වැටුප් තලය :

JM 1-2 : [රු. 43,355 –755x10–1,135x18– 71,335/-]

08. ක්‍රම විශ්ලේෂක

බාහිර අයදුම්කරුවන්

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයක පරිගණක විද්‍යාව / තොරතුරු තාක්ෂණය පිළිබඳ උපාධියක් සමඟ රජයේ / රාජ්‍ය සංස්ථා හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් එක් වසරක අදාළ කේෂ්ත්‍රයේ පළපුරුද්ද ලබා ගැනීම

සහ

අ.පො.ස (සා.පෙළ) විභාගයේ ඉංග්‍රීසි විෂය සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන්

"කළමණාකරණ සහකාර" තනතුරේ I ශ්‍රේණියේ වසර පහක (05)ක අදාළ ක්ෂේත්‍රයේ සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

වයස :අවුරුදු 22ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

වැටුප් කේතය හා වැටුප් පරිමාණය :

JM 1-2 : (රු.43,355–755x10 –1,135x18–71,335/-)

09. ප්‍රවෘත්ති හා ප්‍රකාශන නිලධාරි(දෙමළ/ඉංග්‍රිසි)

සුදුසුකම් සහ පළපුරුද්ද

බාහිර අයදුම්කරුවන්

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් (අදාළ වන පරිදි) ඉංග්‍රිසි/දෙමළ භාෂාව සහිතව සමාජයීය විද්‍යා ක්ෂේත්‍රයේ උපාධිය සමඟ රජයේ දෙපාර්තමේන්තුවක/ සංස්ථාවක/ මණ්ඩලයක හෝ පිළිගත් වාණිජ ආයතනයක අවම වශයෙන් වසරක (01) ක්ෂේත්‍රයට අදාළව සේවා පළපුරුද්දක් ලබා තිබීම.

සහ

අ.පො.ස. (සා.පෙ.) විභාගයෙන් ඉංග්‍රිසි භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ලබාතිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන්

"කළමණාකරණ සහකාර"I ශ්‍රේණියේ තනතුරක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

වයස :අවුරුදු 22ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

වැටුප් කේතය හා වැටුප් පරිමාණය :

JM 1-2 : (රු.43,355–755x10 –1,135x18–71,335/-)

10. පරිපාලන නිලධාරී

අධ්‍යාපන **සුදුසුකම් සහ පළපුරුද්ද :**

බාහිර : විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් **සමඟ** උපාධියෙන් පසු රජයේ දෙපාර්තමේන්තුවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් වාණිජ ආයතනයක වසරක (01) සේවා පළපුරද්දක් ලබා තිබීම.

සහ

අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයේදී ඉංග්‍රීසි භාෂාවට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම.

අභ්‍යන්තර : තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයෙහි'කලමනාකරණ සහකාර (I ශ්‍රේණිය)' තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

සටහන : පරිගණක මෘදුකාංග භාවිතය පිලිබඳ හැකියාව අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

වයස: අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා වයස් සීමාව අදාළ නොවේ.

වැටුප් සංකේතය සහ වැටුප් තලය :

JM 1-2 : [රු. 43,355 –755x10–1,135x18– 71,335/-]

11. සංඛ්‍යාන සහකාර (උපාධිධාරී)

අධ්‍යාපන සුදුසුකම් සහ පළපුරුද්ද:

බාහිර: සංඛ්‍යානය, ගණිතය, ආර්ථික විද්‍යාව යන විෂයයක් සහිතව පිළිගත් විශ්ව විද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම. උපාධිය සඳහා සංඛ්‍යානය විෂයය හදාරා නැති අපේක්ෂකයින් අ.පො.ස (සා.පෙළ) සඳහා ගණිතයට සම්මාන සාමාර්ථයක් ලබා තිබිය යුතුය. පරිගණක හැකියාව අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

වයස : අවුරුදු 18 කට නොඅඩු විය යුතු අතර අවුරුදු 45කට නොවැඩි විය යුතුය.

වැටුප් සංකේතය හා වැටුප් තලය :

MA-3 : [රු.32,200–445x10–660x11–730x10–750x5- 54,960/-]

12. පුස්තකාල සහකාර

අධ්‍යාපන සුදුසුකම් සහ පළපුරුද්ද

අධ්‍යාපන සුදුසුකම් :

(අ) අ.පො.ස. (සා/පෙ.) විභාගයේදී

- i. සිංහල / දෙමළ
- ii. ඉංග්‍රීසි භාෂාව
- iii. ගණිතය ඇතුළුව විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථ සහිතව අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් එක් වාරයකදී විෂයයන් හයකින් සමත් වී තිබීම.

(ආ) අ.පො.ස. (උ/පෙ.) විභාගයේදී "සාමාන්‍ය පොදු පරීක්ෂණය" හැර සියලුම විෂයන්ගෙන් සමත්ව තෘතීය අධ්‍යාපන පාඨමාලාවක් හැදෑරීම සඳහා අවශ්‍ය කාර්ය සාධන මට්ටම ලබා තිබීම.

වෘත්තීය සුදුසුකම් :

ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ හෝ ඒ හා සමාන ආයතනයක පුස්තකාල හා විඥාපන විද්‍යාව පිලිබඳ ඩිප්ලෝමාව (පළමු අදියර)

සහ

අදාල ක්ෂේත්‍රයේ වසරක පළපුරුද්දක් ලබා තිබීම.

වයස :

අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

වැටුප් කේතය හා වැටුප් පරිමාණය :

MA 2-2 : [රු.30,310 –300x10–350x7–600x4–710x20– 52,360/-]

13. පරිගණක තාක්ෂණ සහකාර

සුදුසුකම් සහ පලපුරුද්ද

අධ්‍යාපනික සුදුසුකම් :

(අ) i.සිංහල / දෙමළ

ii.ඉංග්‍රීසි භාෂාව

iii.ගණිතය ඇතුළුව විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථ සහිතව අ.පො.ස. (සා.පෙ)විභාගයෙන් එක් වතාවකදී විෂයන් හයකින් සමත් වී තිබීම.

(ආ) අ.පො.ස. (උ.පෙ.) විභාගයේදී “සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර අවශ්‍ය විෂයයන් සංඛ්‍යාවෙන් සාමාර්ථය ලැබ තෘතීය අධ්‍යාපන පාඨමාලාවක් හැදෑරීමට අවශ්‍ය කාර්ය සාධන මට්ටම අත් කර ගෙන තිබීම.

වෘත්තීය සුදුසුකම් :

පිළිගත් ආයතනකින් ලබා ගත් පරිගණක මෘදුකාංග / දෘඩාංග පිළිබඳ එක් අවුරුදු ඩිප්ලෝමාවක් හෝ සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම හෝ ඊට සමාන සුදුසුකම් ලබා තිබීම. (N.V.Q. 05 ට නො අඩු)

සහ

අදාල ක්ෂේත්‍ර යේ වසරක (01) පලපුරුද්දක් ලබා තිබීම.

වයස :

අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

වැටුප් සංකේතය හා වැටුප් පරිමාණය

MA 2-2 : [රු.30,310 –300x10 –350x7 –600x4 –710x20 –

52,360/-]

14. ප්‍රවාහන සහකාර

සුදුසුකම් සහ පළපුරුද්ද

අධ්‍යාපන සුදුසුකම් :

(අ) අ.පො.ස. (සා/පෙ.) විභාගයේදී

i. සිංහල / දෙමළ

ii. ඉංග්‍රීසි භාෂාව

iii. ගණිතයඇතුළුව විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථ සහිතව අ.පො.ස. (සා/පෙ.) එක් වාරයකදී විෂයයන් හයකින් සමත් වී තිබීම.

සහ

(ආ) අ.පො.ස. (උ/පෙ.) විභාගයේදී "සාමාන්‍ය පොදු පරීක්ෂණය" හැර සියලුම විෂයන්ගෙන් සමත්ව වෘත්තීය අධ්‍යාපන පාඨමාලාවක් හැදෑරීම සඳහා අවශ්‍ය කාර්ය සාධන මට්ටම ලබා තිබීම.

වෘත්තීය සුදුසුකම් :

මෝටර් යාන්ත්‍රික විද්‍යාව/ ප්‍රවාහනය හෝ ඊට සමාන ක්ෂේත්‍රයක් පිළිබඳව වසර දෙකක ඩිප්ලෝමා හෝ සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම

සහ

රජයේ හෝ පිළිගත් පෞද්ගලික ආයතනයකින් පාඨමාලාව හැදෑරීමෙන් පසුව අදාල ක්ෂේත්‍රයේ වසරක පළපුරුද්දක් ලබා තිබීම.

වයස :අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

වැටුප් කේතය හා වැටුප් පරිමාණය :

MA 2-2 : [රු. 30,310 –300x10 –350x7 –600x4 –710x20 – 52,360/-]

15. කළමණාකරණ සහකාර (තාක්ෂණ නොවන)

අවශ්‍ය සුදුසුකම් (පොදු)

බාහිර අයදුම්කරුවන් :-

අධ්‍යාපන සුදුසුකම් :

(අ) i. සිංහල / දෙමළ

ii. ඉංග්‍රීසි භාෂාව

iii. ගණිතය ඇතුළුව විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථ සහිතව අ.පො.ස. (සා.පෙ)විභාගයෙන් එක් වතාවකදී විෂයන් හයකින් සමත් වී තිබීම.

(ආ) අ.පො.ස. (උ.පෙ.) විභාගයේදී "සාමාන්‍ය පොදු පරීක්ෂණය" හැර විෂයයන් තුනකින් සමත්වතිබීම.

විශේෂ කුසලතා

පරිගණක මෘදුකාංග භාවිතය පිළිබඳ හැකියාව

සිංහල / දෙමළ සහ ඉංග්‍රීසි යතුරුලියනය

අභ්‍යන්තර අයදුම්කරුවන් :-

පහත සඳහන් සුදුසුකම් තිබෙන ප්‍රාථමික මට්ටමේ කාණ්ඩයට අයත් පුහුණු ප්‍රාථමික මට්ටමේ ,අර්ධ පුහුණු සහ ප්‍රාථමික මට්ටමේ නුපුහුණු සේවකයන්ට අයදුම් කළ හැකිය.

අධ්‍යාපන සුදුසුකම් :

(අ)i. සිංහල / දෙමළ

ii. ඉංග්‍රීසි භාෂාව

iii.ගණිතය ඇතුළුව විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථ සහිතව අ.පො.ස. (සා.පෙ) විභාගයෙන් විෂයන් හයකින් සමත් වී තිබීම.

වෙනත් සුදුසුකම් :

ඉහත දැක්වෙන සේවා කාණ්ඩයේ ස්ථිර තනතුරක වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

විශේෂ කුසලතා

පරිගණක මෘදුකාංග අදාල කර ගැනීම පිළිබඳ හැකියාව. සිංහල / දෙමළ සහ ඉංග්‍රීසි යතුරුලියනය

වයස : අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

වැටුප් සංකේතය හා වැටුප් පරිමාණය

MA 1-2 : (රු.27,910–300x10–350x7–600x12–710x12–49,080/-)

සටහන :- ස්ථිර තනතුරකට පත් කිරීමට පෙර යම් සේවා කාලයක් වේ නම් එය හෝ යම් තනතුරකට ස්ථිර පදනම මත පත් කිරීම සඳහා පූර්ව අවශ්‍යතාවයක් වශයෙන් පුහුණුව යටතේ සම්පූර්ණ කළ යුතු යම් සේවා කාලයක් වේ නම් එයද ඉහත සඳහන් කර ඇති පරිදි සුදුසුකම් සපුරාලීම සඳහා අවශ්‍ය පස් අවුරුදු සේවා කාලයට ගණන් නොගත යුතුය. එමෙන්ම අනියම් / තාවකාලික පදනම මත වූ

සේවා කාලයන්ද මෙම කාර්යය සඳහා ගණන් නොගත යුතුය.

වෙනත් ප්‍රතිලාභ :

අයදුම්කරුවන් තම වැටුපෙන් 10% ක් සේවක අර්ථසාධක අරමුදලට (EPF) දායකත්වය දැරිය යුතු අතර, ආයතනය විසින් ඒ සඳහා වැටුපෙන් 15% ක් සේවක අර්ථසාධක අරමුදලට(EPF) සහ 3% ක් සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදලට (ETF) දායකත්වයක් දරනු ඇත.

ඉහත සඳහන් වැටුප් වලට අමතරව සියලුම තනතුරු සඳහා රජය විසින් අනුමත ජීවන වියදම් දීමනාව සහ අනෙකුත් දීමනා ගෙවනු ලැබේ.

ආයතනයේ කාර්ය මණ්ඩලය සඳහා වෛද්‍ය ප්‍රතිලාභ හිමිකම් යෝජනා ක්‍රමයක්ද ක්‍රියාත්මක කෙරේ.

අධ්‍යාපන සුදුසුකම් සහ සේවා පළපුරුද්ද සනාථ කරන සහතික වල පිටපත් ද ඥාති සම්බන්ධයක් නැති විස්තර සැපයිය හැකි දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් ද සහිත සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර **අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී, හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය, 114, විජේරාම මාවත,කොළඹ 07** යන ලිපිනයට **2021 මාර්තු 12** වන දින හෝ ඊට පෙර **ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.** අයදුම් කරන තනතුර ලියුම් කවරයෙහි ඉහළ වම් කෙළවරෙහි පැහැදිලිව සඳහන් කළ යුතුය. ඉල්ලුම්පත්‍ර කාර්යාල වේලාවන් තුළදී ආයතනයේ ලේඛකාධිකාරි කාර්යාලයෙන් ලබා ගත හැකිය. එසේ නැතහොත් ආයතනයේ වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය. සියලු විස්තර www.harti.gov.lk වෙබ් අඩවියෙහි අන්තර්ගතය.

රජයේ ව්‍යවස්ථාපිත මණ්ඩල, සංස්ථා හෝ දෙපාර්තමේන්තුවල ඉල්ලුම්කරුවන් සිය ඉල්ලුම් පත්‍ර ආයතන ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කළ යුතුය.

අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරි

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

114, විජේරාම මාවත,

කොළඹ 07.

011 – 2696981

Source: www.harti.gov.lk (2021.02.26)